**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - 2018**

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.43,215,814 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි.<br>ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කළයුතු වත්කම් හදුනාගෙන ප්‍රත්‍යාගණන වටිනාකම් ගිණුම්ගත කිරීමට අපේක්ෂා කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදය ප්‍රකාරව පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කිරීමේදී ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කරමින් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සිදුකල යුතු වුවත් විද්‍යායතනය ඒ අනුව සේවක පාරිතෝෂික ගණනය කිරීම් සිදුකර නොතිබුණි. | 2019 වර්ෂයේදී ප්‍රමිතිය අනුව කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 අනුව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනය සතු පර්චස් 243.9 ක් වූ බිම් කැබලි 3 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණු බැවින් ආයතනය සතු ඉඩම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය නොවීය. | ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාව ගිණුම් තැබීමේ අවශ්‍යතාවයට ගැලපෙන ලෙස නොවූ බැවින් නැවත තක්සේරු කිරීමට අවධානය යොමුකර ඇත. | වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1995 මාර්තු 13 දිනැති අංක 862/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 5 ඡේදය | සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා නිලබලයෙන් පත්වන විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපතිවරයා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත්කළ නියෝජිතයෙකු සහභාගිවී නොතිබියදී නියමාවලියේ 5 ඡේදය ප්‍රකාරව වෙනත් සාමාජිකයෙකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා දැනුවත් කර ඇත. | නියමාවලිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,898,494 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,170,342 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,728,152 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ගිවිසුම්ගත සේවා වියදම රු.4,700,809 කින් හා ස්වයං මූල්‍ය වැඩසටහන් වෙනුවෙන් දරන ලද වියදම රු.2,008,713 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ වූ ආපසු ගෙවිය යුතු රඳවාගැනීම් හා විවිධ ඇප තැන්පතුවල වටිනාකම රු.15,093,438 ක් වූ අතර ඉන් රු.812,269 ක් වූ ශේෂයන් වර්ෂ 3 සිට වර්ෂ 5 ක් අතර කාලයක් පැරණි ශේෂයන් විය. | තැන්පතු නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරන බව. | කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විද්‍යායතනයේ ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම සඳහා 2010 වර්ෂයේදී රු.824,000 ක් වැයකර මිලදීගෙන තිබුණු පරිගණක මෘදුකාංග පද්ධතියෙහි වත්කම් මිලදී ගැනීම් සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් කර තිබුණි. | පරිගණක මෘදුකාංගය තාක්ෂණික වශයෙන් දුර්වල තත්වයක තිබෙන නිසා යාවත්කාලීන කරමින් පවතී. | වත්කම්වලට අදාළ සියළු ගනුදෙනු පරිගණක මෘදුකාංග පද්ධතියට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | කථිකාචාර්යවරයෙකුගේ දේශනවලට සහභාගී වීම සිසුන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 2017 වර්ෂයේ අගෝස්තු සිට විගණිත දිනය වූ 2019 පෙබරවාරි 28 දක්වා අදාළ කථිකාචාර්යවරයා දේශන, විභාග රාජකාරි සහ අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී නොවුණත් එම කාලසීමාව සඳහා ඔහුට සියළු දීමනා සමඟ වැටුප් ලෙස රු.3,336,200 ක් ගෙවා තිබුණි. එම කථිකාචාර්යවරයාගේ දේශන ආවරණය කිරීම සඳහා 2017 නොවැම්බර් 22 දින සිට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන 2018 වර්ෂයේදී මේ වෙනුවෙන් බාහිර දේශන ගාස්තු ලෙස රු.148,500 ක් වැයකර තිබුණි. | කළමනාකරණ මණ්ඩලයේදී සාකච්ඡා කළ අතර ගැටළුව නිරාකරණය වන තුරු තාවකාලික කථිකාචාර්යරුන්ගේ සහයෝගයෙන් පුරප්පාඩුව සපුරාගෙන ඇත.කථිකාචාර්යවරයා දේශන සඳහා සහභාගී නොවූවද, විෂයමාලා සංශෝධන කටයුතුවල හා අධ්‍යානාංශයේ අනෙකුත් කටයුතුවල නිරත විය. | කථිකාචාර්යවරුන් දේශන සඳහා ද සහභාගී කරගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 සැප්තැම්බර් 12 දින නිදහස් දීමනාවකින් විද්‍යායතනයට පවරාදී තිබුණු හෙක්ටයාර් 2.3533 ක බිම් ප්‍රමාණයකින් යුත් වතුපිටිවල පිහිටි ඖෂධ උද්‍යානය විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන ආකාරයට නිසි සැලැස්මක් යටතේ සංවර්ධනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයන් තුළ මේ පිළිබඳ පියවර ගැනීමට නියමිතය. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සරිලන පරිදි විෂය ක්ෂේත්‍ර සංශෝධනය කිරීම්, නවීන ක්‍රම හා නව සොයාගැනීම් සහ නව ඉගැන්වීම් ක්‍රම ඔස්සේ දේශීය වෛද්‍ය විද්‍යාව දියුණු කළ යුතු විය. වර්තමානයේදී දේශීය වෛද්‍ය විද්‍යාවේ වැදගත්කම හා එහි විශ්වාසවන්තභාවය පිළිබඳ ජනතාව තුළ ආකල්පමය වශයෙන් සංවර්ධනයක් ඇතිකිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් ක්‍රියාත්මක කළ යුතු විය. මේ සඳහා විද්‍යායතනයේ කථිකාචාර්යවරුන් පර්යේෂණවල නියැලීම ඉතාමත් වැදගත් කාර්ය භාර්යක් බව නිරීක්ෂණය විය. ඒ අනුව, වර්තමානයේ විද්‍යායතනයට කථිකාචාර්යවරුන් 34 දෙනෙකු අනුයුක්තව සිටියද ඔවුන් 2017 සහ 2018 වර්ෂවල පර්යේෂණ සඳහා යොමු වී නොතිබුණි. | පර්යේෂණ කමිටු පිහිටුවා ආයතනයේ ආචාර්යවරුන් පර්යේෂණ කටයුතු සඳහා දිරිගැන්වීමට කටයුතු කරනු ලැබේ. | පර්යේෂණ කටයුතු සඳහා දිරි ගැන්වීමට සහ ඒ තුළින් දේශීය වෛද්‍ය විද්‍යාව දියුණු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017/2018 අධ්‍යයන වර්ෂයේ විද්‍යාපති පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලාව සහ සහතික පත්‍ර පාඨමාලා 09 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 04 ක් සහ විද්‍යාපති පාඨමාලා 02 ක් පමණක් පවත්වා තිබුණි. | පාඨමාලා විෂය නිර්දේශ සංශෝධනයන් හේතුවෙන් සිසුන් බඳවාගනු නොලැබිණි. | සැලසුම්කළ පරිදි සිසුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2013/2014 අධ්‍යයන වර්ෂයෙන් පසුව ආයුර්වේද ආයතන කළමනාකරණ හා පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හා විද්‍යාපති පාඨමාලාවන්ද 2016/2017 අධ්‍යයන වර්ෂයෙන් පසු පංචකර්ම විද්‍යාපති හා ශල්‍යතන්ත්‍ර පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන්ද ක්‍රියාත්මක කර නොතිබුණි. | සිසුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇති අතර ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරමින් පවතී. | ප්‍රමාදයකින් තොරව සිසුන් බඳවා ගැනීමේ කාර්යයන් සිදු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී කායවර්ධන මධ්‍යස්ථානය සඳහා රු.1,118,750ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණද එහි උපදේශකවරයෙකු නොමැති බැවින් මෙම උපකරණ ඵලදායී ආකාරයෙන් පරිහරණය කිරීමට සිසුන්ට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී මෙම තනතුර පිරවීමට නියමිතය. | උපකරණ අදාළ අරමුණ ඉටු කර ගැනීම සඳහා උපයෝජනය කළ යුතු අතර පුරප්පාඩු වූ තනතුර පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විද්‍යායතනයේ සිසුන් 600 කට අධ්‍යයන පහසුකම් ඇතිකර තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපනය හදාරන සිසුන් සංඛ්‍යාව 398 ක් වූයෙන් උපයෝජනය සියයට 66 ක් විය. දේශීය වෛද්‍ය විෂය ප්‍රචලිත කිරීම විද්‍යායතනයේ මූලික අරමුණක් වුවද රටට අවශ්‍ය දේශීය වෛද්‍යවරුන් බිහිකිරීමේ කාර්යය අපේක්ෂිත මට්ටමක නොතිබීමෙන් විද්‍යායතනයේ සම්පත් ඌන උපයෝජිතව පැවතුණි. | විද්‍යායතනයේ පසුගිය කාලය තුළ ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරියේදී වැඩි පිරිසකට සම්පත් භාවිතා කිරීමට ඉඩ සැලසෙනු ඇත. | පවතින සම්පත් උපරිම ඵලදායිතාවයෙන් යුක්තව භාවිතා කිරීමට හැකිවන පරිදි වැඩි සිසුන් පිරිසක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ග මීටර් 990 ක මහල් 04කින් යුත් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ රු. මිලියන 79 ක ඇස්තමේන්තුව 2011 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල විසින් අනුමත කර තිබුණද වැඩ ආරම්භ කිරීමේදී අනුමැතියකින් තොරව එය වර්ග මීටර 1,475 ක් දක්වා වැඩිකර තිබුණි. | ඉදිරියේදී අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 134.4 ක් වූ අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භයේ සිට මන්දගාමී තත්ත්වයේ පැවති බව ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා අනුව අනාවරණය විය. 2016 අගෝස්තු 31 දින සිට 2018 මැයි 31 දින දක්වා වරින්වර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කාලය වසර දෙකකට ආසන්න කාලයකට දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීම් කරන ලද මුදල රු.13,332,311 ක් විය. 2018 පෙබරවාරි 25 දින සිට කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු නවතා දමා කොළඹ වාණිජ අධිකරණයේ නඩුවක්ද ගොනුකර තිබුණි. | දැරීමට සිදුවන අමතර පිරිවැය ඇස්තමේන්තු කර අදාළ සමාගමෙන් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බව. | අමතර පිරිවැය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සප්ත වාර්ෂික නිවාඩු හා කථිකාචාර්යවරුන් 09 දෙනෙකු අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබුණු බැවින් හා අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 15 ක් පැවති බැවින් අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලයේ සියයට 53 ක පමණ ඌනතාවයක් තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විද්‍යායතනය ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අනුව ඉලක්ක 9 ක් යටතේ කාර්යයන් 90 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද ඉන් කාර්යයන් 36 ක් ඉටුකර ගෙන නොතිබුණු අතර ඉටුකළ කාර්යයන් 7 ක ප්‍රගතිය සියයට 50 කට අඩු මට්ටමක පැවතුණි. | අධ්‍යක්ෂතුමාගේ ඉල්ලා අස්වීම හා ශිෂ්‍යයින් අධ්‍යයන කටයුතුවලින් ඉවත් වී සිටීම බලපා ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක කරා ළඟා විය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකාවේ හෝ පිටරට විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ ඉගැන්වීම්, පුහුණු කිරීම් හා පර්යේෂණ කටයුතු සඳහා ආචාර්යවරුන් හා ශිෂ්‍යයින් හුවමාරුකර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම විද්‍යායතනයේ කාර්යභාර්යක් වුවද එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරිමට කටයුතු කර නොතිබුණි. | මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අයවැය ප්‍රතිපාදන සලසා ඇති බවත්,වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. | අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය ලෙස ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කළ යුතුය. |